# පළාත් පාලන ඡන්ද විමසීම 2018

## ඡන්දදායකයකු ලෙස නොව
## පුරවැසියකු ලෙස ඔබ දැනගත යුතු කරුණු


සම්පාදනය

නීතිඥ ජගත් ලියනආරච්චි



ප්‍රකාශනය

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය

(CaFFE)

# පෙරවදන

පළාත් පාලන ඡන්ද විමසීමේ ආඥා පනත සංශෝධනය කිරීමෙන් ලංකාවේ නව පළාත් ඡන්ද ක්‍රමයක් ක්‍රියාත්මක වීම ඇරඹී ඇත. එහි මූලික ලක්ෂණ කිහිපයකි.

1. මනාප ක්‍රමය අහෝසි වී නව කොට්ඨාශ මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දී ඇත.

2. කොට්ඨාශ සඳහා 10% ක කාන්තා නියෝජනයක්, කාන්තාවන් 50%ක් සහිත අතිරේක ලැයිස්තුවක් හඳුන්වා දී ඇත.

3. නව මැතිවරණ ක්‍රමය යටතේ ඡන්දය ගණන් කිරීම ඡන්ද පොළේදීම සිදු කිරීම විශේෂත්වයකි.

4. නව මැතිවරණ ක්‍රමය යටතේ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් 50% කට වැඩි සභික සංඛ්‍යාවක් ලබා ගැනීම පහසු නොවනු ඇත.

ඒ අනුව, පළාත් පාලන ආයතනයේ සභාපති, උප සභාපති තනතුරු සඳහා සභිකයින් පත් වනු ඇත්තේ රහස් ඡන්ද විමසීමක් මගිනි. නව ක්‍රමයක් යටතේ ඡන්දය පැවැත්වෙන විට එයට සහභාගි වන සියළු පාර්ශව, ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක්, අවබෝධයක් ලබා තිබීම අවශ්‍යය. ඒ සඳහා ඡන්ද විමසීම පිළිබඳ නීතිය සරළ පැහැදිලි ලෙස ජනතාව වෙත සන්නිවේදනය විය යුතුය. කැෆේ සංවිධානයේ ඉල්ලීම මත නීතිඥ ජගත් ලියනආරච්චි මහතා දින කිහිපයකින් සකස් කළ මෙම කෘතිය එම අවශ්‍යතාව යම් ප්‍රමාණයකට හෝ ඉටු කරනු ඇත.

නිදහස් හා සාධාරණ මැතිවරණයක් තහවුරු කළ හැක්කේ මැතිවරණ නීතිය පිළිබඳ අපේක්ෂකයින්, ඔවුන්ගේ ආධාරකරුවන්, ඡන්දදායකයින්, පුරවැසියන් දැනුවත් කිරීම මගිනි. ඒ සඳහා මෙම කෘතිය පිටුවහලක් වනු ඇත.

කීර්ති තෙන්නකෝන්
විධායක අධ්‍යක්ෂ/කැෆේ සංවිධානය

2018 ජනවාරි 10



# පළාත් පාලන ඡන්ද විමසීම-2018

## ඡන්දදායකයකු ලෙස නොව පුරවැසියකු ලෙස ඔබ දැනගත යුතු කරුණු

පෙලගැස්ම


1.පළාත් පාලනය ආයතන යනු මොනවාද............................04

2. පළාත් පාලන ඡන්දයෙන් මහජන නියෝජිතයින් තෝරාගන්නා ආකාරය........................................................05

3. ඡන්ද විමසීම් දිනය...........................................................08

4. ඡන්ද විමසීමට අදාලව වැරදි හා දූෂණ..............................12

5.මැතිවරණ කොමිෂන් සභාවේ සබඳතා...............................15

6.මැතිවරණ නිරීක්ෂණ ආයතනවල සබඳතා..........................16




# 1. පළාත් පාලන ආයතන යනු මොනවාද ?

## I.හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මහජන නියෝජිත ආයතන මට්ටම් 3 කින් පවතී. එනම් පාර්ලිමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන යනුවෙනි. ඒ අනුව ජනතාවට වඩාත් සමීප හා වැඩිම සභික සංඛ්‍යාවක් සිටින මහජන නියෝජිත පාලන ව්‍යුහය වන්නේ පළාත් පාලන ආයතනයි.

මෙම පළාත් පාලන ආයතන වර්ග 3ක් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබේ. එනම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා, මෙම පළාත් පාලන ආයතන සංඛ්‍යාත්මකව ගත් කළ පහත පරිදි දැක්විය හැකිය.

මහ නගර සභා 24
නගර සභා 41
ප්‍රාදේශීය සභා 276

මෙම සමස්ත පළාත් පාලන ආයතන සඳහා සභික සභිකාවියන් අවම වශයෙන් 8346 දෙනෙක් පමණ පත්වීමට නියමිත ය.

පළාත් පාලන ආයතනයක ප්‍රධාන කාර්යයන්

- මහජන සෞඛ්‍යය
- පොදු මහජන සේවා
- මංමාවත් නඩත්තුව හා සංවර්ධනය
- බලපත්‍ර ගාස්තු අයකිරීම
- බදු අයකිරීම
- පුණ්‍යාධාර දීම
- තොටුපලවල් පිහිටු වීම
- ආගමික සංස්කෘතික උත්සව සංවිධානය
- පානීය ජල සැපයුම
- ප්‍රදේශයේ පදිංචිකරුවන්ට රැකියා වැඩපිළිවෙලවල සකස් කිරීම

## II. පළාත් පාලන ආයතනයක බලතල

- පරිසර බලපත්‍ර නිකුත්කිරීමේ බලය
- ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය දීමේ බලය
- ගව ඝාතනාගාර සඳහා බලපත්‍ර දීමේ බලය
- පීඩාවන් ඉවත් කිරීමේ බලය
- ගොඩනැගිලි ඉදිකිරීම් පරීක්ෂා කිරීමේ බලය
- මහජනයාට අන්තරායකර ගොඩනැගිලි හා ගස් ඉවත් කිරීමේ බලය මේ අතරින් ප්‍රධාන වේ.

# 2. පළාත් පාලන ඡන්දයෙන් මහජන නියෝජිතයින් තෝරාගන්නා ආකාරය

## I.හැඳින්වීම

පළාත් පාලන අයතන සඳහා සභිකයන් තෝරාගැනීම සිදුකරනු ලබන්නේ මැතිවරණ කොමිෂන් සභාව මගිනි. මේ සඳහා භාවිත කරනු ලබන්නේ "පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය)" වේ. මෙහි මුල් පනත 1646 අංක 53 වන අතර වාර ගනනාවක් සංශෝධනයට ලක්ව තිබේ.

මේ අතරින් මෑත කාලීන සංශෝධනයන් වු

- 2012 අංක 22 දරණ පළාත් පාලන මැතිවරණ(සංශෝධන)පනත
- 2016 අංක 1 දරණ පළාත් පාලන මැතිවරණ(සංශෝධන) පනත
- 2017 අංක 16 දරණ පළාත් පාලන මැතිවරණ(සංශෝධන) පනත
- 2017 අංක 31 දරණ පළාත් පාලන මැතිවරණ(සංශෝධන) පනත

මෙම මැතිවරණය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ.

## II.මෙවර ඡන්ද විමසීමේ පවතින විශේෂතා

මෙවර පළාත් පාලන ඡන්ද විමසීම ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ ඉතා වැදගත් ඡන්ද විමසීමක් වේ. එයට හේතුව වන්නේ කොට්ඨාශ ක්‍රමය හා සමානුපාතික ක්‍රමය මිශ්‍ර වූ ඡන්ද විමසීමක් ලෙස පවත්වන පළමු අවස්ථාව මෙය වීමයි. මෙම ඡන්ද විමසීමේ අනෙක් විශේෂත්වය වන්නේ කාන්තා නියෝජනය අනිවාර්ය අංගයක් ලෙස පවත්වන පලමු ඡන්ද විමසීම වීමයි.

මේ අනුව මෙම ඡන්ද විමසීමේදී සෑම පළාත් පාලන ආයතනයකට හිමි සභික සංඛ්‍යාවෙන් 60% කොට්ඨාශ ක්‍රමයටද ඉතිරි 40% සමානුපාතික ක්‍රමයටද තොරාපත් කරගනු ලැබේ.

මේ අනුව මෙවර ඡන්ද විමසීමේදී ශ්‍රී ලංකාව පුරා පවතින පළාත් පාලන ආයතන 341 සඳහා අවම වශයෙන් 8346 දෙනෙක් පමණ පත්වීමට නියමිත ය. මෙතෙක් පැවති ක්‍රමයට අනුව පළාත් පාලන ඡන්ද විමසීමකින් තෝරාගැනුනේ සභිකයින් 4386 දෙනෙකි.

## III. මෙවර ඡන්ද විමසීමේ නාමයෝජනා ඉදිරිපත් කිරීම

මෙවර ඡන්ද විමසිමට ඉදිරිපත් වන සියලුම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නාම යෝජනා ලැයිස්තු 2ක් ඉදිරිපත් කල යුතුය.

1. **පළමු නාමයෝජනා පත්‍රය** - පළාත් පාලන බල ප්‍රදේශයේ කොට්ඨාශ වෙනුවෙන් ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ ලැයිස්තුව.

2. **අතිරේක නාමයෝජනා පත්‍රය** - පළාත් පාලන ආයතනයෙන් තෝරාපත් කරගත යුතු සභික සංඛ්‍යාවෙන් 40% කට 3ක් එකතු කිරීමෙන් ලබාගන්නා සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක අපේක්ෂකයින්ගේ ලැයිස්තුව.

මෙම පළමු ලැයිස්තුවෙන් 10% ක් හා අතිරේක ලැයිස්තුවෙන් 50% ක් කාන්තා අපේක්ෂිකාවන් විය යුතුය.

එක් එක් පළාත් පාලන ආයතනය සඳහා එක් එක් ලැයිස්තුවට ඇතුළත් විය යුතු මුළු සභික සංඛ්‍යාව හා අවම කාන්තා අපේක්ෂිකාවන්ගේ සංඛ්‍යාව මැතිවරණ කොමිසම විසින් ගැසට් පත්‍රයේ පලකරනු ලැබේ.

## VI.සභිකයින් තෝරාගැනීම

- **කේවල කොට්ඨාසයේ සභිකයා තෝරා ගැනීම**

අදාළ කේවල කොට්ඨාශයේ සියලුම ඡන්ද ගනන් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයා අදාල කොට්ඨාශයෙන් එම පළාත් පාලන ආයතනය නියෝජනය කරන සභිකයා ලෙස තෝරාගනු ලැබේ.

- **බහු සභික කොට්ඨාසයේ සභිකයින් තෝරාගැනීම**

අදාළ බහු සභික කොට්ඨාසයේ සියලුම ඡන්ද ගණන් කිරීමෙන් අනතුරුව වැඩිම ඡන්ද ලබාගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයින් දෙදෙනා/තිදෙනා අදාළ කොට්ඨාසයෙන් එම පළාත් පාලන ආයතනය නියෝජනය කරන සභිකයන් ලෙස තෝරාගනු ලැබේ.

- **සමානුපාතික සභිකයින් තෝරාගැනීම**

- අදාළ පළත් පාලන ආයතනයේ සමස්ත වලංගු ඡන්ද ප්‍රමාණය එම පළාත් පාලන ආයතනයට පත්විය යුතු මුළු සභික සංඛ්‍යාවෙන් බෙදා "තීරක අංකය" නිශ්චය කරනු ලැබේ.

- අදාළ දේශපාලන පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව එම තීරක අංකයෙන් බෙදා එම දේශාපලන පක්ෂයට එම පළාත් පාලන ආයතනයට ලැබිය යුතු සමස්ත සභික සංඛ්‍යාව නිශ්චය කරනු ලැබේ.

- එකී සමස්ත සභික සංඛ්‍යාවෙන් එම දේශපාලන පක්ෂය ඒ වන විටත් කොට්ඨාස මඟින් තෝරාගෙන ඇති සභික සංඛ්‍යාව අඩු කල විට එකී දේශපාලන පක්ෂයෙන් එම පළාත් පාලන ආයතනයට සමානුපාතික ක්‍රමයට තෝරාපත් කළ යුතු සභික සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

- **කාන්තා සභික සංඛ්‍යාව තෝරාගැනීම**

- ඡන්ද විමසීමේදී ලැබූ මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් 20% කට වඩා අඩු ඡන්ද ලබාගත් හා සභිකයින් තිදෙනෙකුට හෝ ඊට අඩුවෙන් තෝරාපත් කරගත් පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව මුළු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කරනු ලැබේ.

- එකී සංඛ්‍යාව පළාත් පාලන ආයතනයට තෝරා පත්කර ගතයුතු මුළු සභික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට සමාන සංඛ්‍යාවෙන් බෙදනු ලැබේ. එය කාන්තා නියෝජනයට අදාළ “තීරක අගය” ලෙස සලකනු ලැබේ.

- එක් එක් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එම තීරක අගයෙන් බෙදීමෙන් එම දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම නියෝජනය කළ යුතු කාන්තා නියෝජිතයින් සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

ඒ වන විටත් කොට්ඨාස මගින් තේරී ඇති කාන්තා නියෝජිතයින් සංඛ්‍යාවට අමතරව පක්ෂය විසින් තෝරාගත යුතු ඉතිරි සභික සංඛ්‍යාව සමානුපාතික ක්‍රමය යටතේ අදාළ පක්ෂයට හිමි සභික සංඛ්‍යාවෙන් පත් කරනු ලැබේ.

# 3. ඡන්ද විමසීම් දිනය

## I. ඡන්ද විමසීමේ කාලසීමාව (41 වගන්තිය)

නියමිත දින ඡන්ද විමසීම පෙරවරු 7.00ට ආරම්භ විය යුතු අතර එය පස්වරු 4.00ට අවසන් කල යුතුය

## II. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව (39අ වන වගන්තිය)

අදාළ ඡන්ද විමසීම් ප්‍රදේශයේ තේරීම් භාර නිලධාරි වරයා විසින් ඡන්ද නාමලේඛනයේ සිටින සෑම ඡන්ද දායකයකුටම මැතිවරණයට අදාල විස්තර සහිතව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් තැපැල් මගින් යවනු ලැබේ. එය සෑම ඡන්ද දායකයකු වෙතම ඡන්ද විමසීමට දින 5කට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එකී නිළ දැන්වීම් පත්‍රිකාව තැපැල් මගින් භාරදීමට නොහැකිවන විට අදාළ තැපැල් කාර්යාලයේ තබාගෙන නියමිත ඡන්ද දායකයෙකු පැමිණි විට එය තැපැල් ස්ථානාධිපති විසින් භාරදෙනු ලැබේ.

මෙම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් විකිණීම මිලදී ගැනීම හෝ බලය නොමැතිව සැපයීම හෝ තමන්ට අයත් නැති පත්‍රිකාවක් ළඟ තබාගැනීම වරදකි.

ඡන්ද භාවිතා කිරීම සඳහා නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව අත්‍යවශ්‍ය ලේඛනයක් නොවන නමුත් එය ඡන්ද පොලට රැගෙන යාම මගින් පහසුවක් ඇති කරයි.

## III. ඡන්ද පොල නිලධාරීන් (40 වගන්තිය)

ඡන්ද මධ්‍යස්ථානයේ ප්‍රධාන නිලධාරියා ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා ය. ඔහු යටතේ හඳුනා ගැනීම, ඇඟිලිවල තීන්ත ආලේප කිරීම, ඡන්ද නාමලේඛනය පරීක්ෂා කිරීම, ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, ආදී කටයුතු සඳහා අවශ්‍ය නිලධාරින් ද ආරක්ෂක කටයුතු සඳහා පොලිස් නිලධාරින්ද, පහසුකම් සැලසීම සඳහා ග්‍රාම නිලධාරි වරයාගේ නියෝජිතයකු ද සේවයේ නිරත වේ.

## IV.ඡන්දපොලවල ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම් (45 වන වගන්තිය)

සෑම ඡන්ද පොලකම අදාළ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් පහත දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය.

- ඡන්දය දෙන ආකාරය පිළිබඳව ඡන්ද දායකයන්ට උපදෙස් දෙන දැන්වීම.
- එක් එක් අපේක්ෂකයන්ගේ නම් හා ඔවුන්ට වෙන්කරන ලද ලකුණු ඇතුළත් දැන්වීම.

## V.ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළු වීමට බලයලත් පුද්ගලයන් (50 වගන්තිය)

- අදාළ ඡන්ද හිමියන්
- ඡන්ද පොළ නිලධාරින්
- බලය ලත් ඡන්ද පොළ නියෝජිතයන්
- සංචාරක මැතිවරණ නිලධාරින් (සහකාර තේරීම්භාර නිලධාරීන්)
- අපේක්ෂකයින් (එක්වරකට එක් අපේක්ෂකයකු පමණි)
- තරග කරන දේශපාලන පක්ෂ ලේකම්
- බලය ලත් මැතිවරණ නිරීක්ෂකයන්
- පොලිස් නිලධාරීන්

## VI.ඡන්ද විමසීම් පවත්වාගෙන යාම ( 53 වගන්තිය )

ඡන්ද පොලක මනා පැවැත්ම පිළිබඳ වගකීම ඡන්ද පොළ නිලධාරී (SPO) සතුය. වරකට ඇතුළු කළ යුතු ඡන්ද දායකයන් ගණන තීරණය කිරීමේ බලය ඔහු සතුය. යම් තැනැත්තකු ඡන්ද මධ්‍යස්ථානය තුළ ස්ථානාධිපතිගේ අණට අකීකරු වුවහොත් හෝ නොමනා ලෙස හැසිරුන හොත් එවැනි අයෙකු ඡන්ද මධ්‍යස්ථානයෙන් ඉවත් කිරීමේ බලය ඔහු සතුය.

## VII.ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ස්ථානාධිපතිගේ කාර්යයන් (වගන්ති ඃ 51)

- ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල ලකුණ,ඡන්ද හිමිගේ නාම ලේඛනය ඡන්ද පොළට පැමිණ සිටින අයට පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය හිස්ව තිබෙන බව පෙන්විය යුතුය.
- ඡන්ද පෙට්ටිය මුද්‍රා තැබීම.

## VIII. ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයන්ට භාරදීමේ පියවරයන්

- ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතෙහි සඳහන් පරිදි ඡන්ද දායකයාගේ නම සහ අංකය හඬ නගා කියවිය යුතුය.
- ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගත යුතුය.
- ඡන්දදායකයාගේ වම් අතේ සුළැගිල්ල මත නියමිත තීන්ත ආලේප කිරීම
- ඡන්දදායකයාගේ අංකය ඡන්ද පත්‍රිකා පොතෙහි උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව කඩා ඉවත් කළ යුතුය.
- ඡන්ද පත්‍රිකාව නිල ලකුණින් මුද්‍රා තැබිය යුතුය.
(තෙරපීම හෝ සිදුරු කිරීම)
- අදාළ ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ බව දැක්වීම පිණිස ඡන්ද නාම ලේඛනයේ ලකුණක් යෙදිය යුතුය.(මෙහිදී ඡන්ද පත්‍රිකාවේ අංකය නොයෙදිය යුතුය)

- ඡන්ද දායකයන් සඳහා වම් සුළැගිල්ලේ නොමැකිය හැකි තීන්ත ලකුණක් යෙදිය යුතුය.
- ඡන්ද පත්‍රිකාව ඡන්ද දායකයාට භාර දිය යුතුය.

## IX. ඡන්දය දෙන ආකාරය (53 වන වගන්ති)

- ඡන්ද ස්ථානාධිපති විසින් සකස් කර ඇති ආවෘත ස්ථානයක ඡන්දය ප්‍රකාශ කළ යුතුය.

- ඡන්ද දායකයා විසින් ලකුණු කළ ඡන්ද පත්‍රිකාව තමාම ඡන්ද පෙට්ටිය තුළට බහාලිය යුතුය.

- යම් ඡන්ද දායකයකුට ඡන්දය දෙන ආකාරය ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන්ට ද පෙනෙන සේ පැහැදිලි කිරීම ස්ථානාධිපතිවරයාට හෝ ඔහුගේ නියෝජිතයෙකුට කළ හැකියි. නමුත් මෙහිදී යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස උපදෙස් දීමක් හෝ මඟ පෙන්වීමක් නොකළ යුතුය.

- අන්ධ භාවය හෝ යම් ශාරීරික ආබාධයක් නිසා ඡන්දය දීමට අපොහොසත් වන අයෙකුට ස්ථානාධිපතිගේ කාර්යය බලය ඇතිව ඡන්ද දායකයාගේ උපදෙස් මත ඡන්දය ලකුණු කර පෙට්ටිය තුළට බහාලිය හැකිය.

- ඡන්දය භාවිතා කිරිමේදී අනවධානය නිසා වැරදීමක් වුව හොත් එය ස්ථානාධිපතිවරයාට ඉදිරිපත්කර ඔහු සෑහීමකට පත් වුවහොත් නව ඡන්ද පත්‍රිකාවක් නිකුත් කරනු ලැබේ.

- අදාළ ඡන්ද දායකයාගේ ඡන්දය වෙනත් අයෙකු භාවිතා කර ඇති විටක අදාළ ඡන්ද දායකයා වෙත ද්විත්ව ඡන්ද පත්‍රිකාවක් ලබා දෙනු ලැබේ. මෙම ඡන්ද පත්‍රිකාව වෙනත් වර්ණයකින් යුක්ත අතර එය ලබා දීමට පෙර ප්‍රකාශයකට අත්සන් ගනු ලබයි. එසේම ඔහුගේ නම ද්විත්ව ඡන්ද ලේඛනයට ඇතුළත් කළ යුතුය.

## XIII.මැතිවරණ කොමිසමට ඡන්ද මධ්‍යස්ථානයක් ශූන්‍ය කල හැකි අවස්ථා

(2012 අංක අංක 22 දරණ පළාත් පාලන මැතිවරණ(සංශෝධන) පනතින් සංශෝධිත 72අ වගන්තිය)

- නියමිත වේලාවට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකිවීම

- ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම

- ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම

- ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොලෙන් පිටතට පලවා හැරීම

- මාර්ගයේ යම් අවහිරතාවක් නිසා ඡන්දපොල කාර්ය මණ්ඩලයට ඡන්ද පොලට පැමිණීමට නොහැකි වීම

- ඡන්ද පොලේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොලේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම

- කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම

- කිසියම් ඡන්දපොලක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම

මෙවැනි සිදුවීමක් යම් ඡන්ද මධ්‍යස්ථානයක සිදු වුවහොත් ඒ පිලිබඳව අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලධාරී විසින් ඒ බව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කල යුතු අතර කොමිසම විසින් පරීක්ෂණයක් සිදු කර අදාල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය ශූන්‍ය කරනු ලැබේ.

# 4. ඡන්ද විමසීමට අදාළ වැරදි හා දූෂණ

මැතිවරණයකට අදාළව සිදුවිය හැකි වැරදි හා දූෂණ ක්‍රියාවන් විවිධ ක්ෂේත්‍රයන්ගෙන් සිදුවිය හැකිය. ඒ අනුව

## I. මැතිවරණ ප්‍රචාරයන් සම්බන්ධ වැරදි

මැතිවරණ ප්‍රචාරණයට අදාළ නීති උල්ලංඝනය කරමින් සිදුකරන පෝස්ටර් ගැසීම, නිවේදිත නොවන මැතිවරණ ප්‍රචාරක කාර්යාල පවත්වාගෙන යාම, කටවුට් ප්‍රදර්ශනය, අපේක්ෂකයා ගමන් නොකරන වාහනවල ඔහුගේ ඡායාරූපය හා ඡන්ද ලකුණ, අංකය ප්‍රදර්ශනය කිරීම හා පෙළපාලි යාම බහුලව සිදු කරනු ලබන මැතිවරණ ප්‍රචාරයන් සම්බන්ධ වැරදි වේ.

## II. මැතිවරණ ප්‍රචාරයන් සඳහා පොදු දේපළ යොදාගැනීම

මැතිවරණ ප්‍රචාරයන් සඳහා පොදු දේපළ යොදා ගැනීම වරදක් වේ. එය මුදල් රෙගුලාසි අනුවද "ආයතන සංග්‍රය අනුවද, 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහි සිදුකරනු ලබන අපරාධ පිළිබඳ පනත අනුවද අල්ලස් පනත අනුවද පමණක් නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවද එය වරදක් වේ.

එවැනි ක්‍රියා වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව දක්වා සිටයි. ඒ අනුව,

(4) (අ) මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් -

(i) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම

(ii) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම, කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මඟින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ) එවැනි විධානයකට අනුකූල වීම සහ එය ක්‍රියාත්මක කිරීම, තත්කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිලධරයකුගේ ම කාර්යය විය යුත්තේ ය.

කොමිසම විසින් පනවන ඉහත නියෝගවලට අනුකූලව කටයුතු නොකිරීම වරදක් වන අතර එවැනි නිලධාරියකු රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් කළ හැකිය.

මේ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 04 වන දින අංක 2048/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් "ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන, පනවා ඇත.

## III. සීමිත දේශපාලන අයිතිවාසිකම් සහිත නිළධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරතවීම

ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදය අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ඡන්දය දීමේ අයිතිය උරගා බැලීමට හැර රැස්වීම්වලට සහභාගිවීම හා ඕනෑම අපේක්ෂකයෙකුගේ හෝ පක්ෂයක ප්‍රචාරක කටයුතු සමග ක්‍රියාකාරීව සම්බන්ධවීම තහනම් කර ඇත.

එමෙන්ම සාම නිලධාරීන් සන්නද්ධ සේවා නිලධාරීන් හා මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ද මෙම සීමිත මැතිවරණ අයිතිවාසිකම් සහිත නිලධාරීන් ගනයට වැටේ. එවැනි අයෙකු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සම්බන්ධ වීම වරදකි.

## IV. ඡන්ද පත්‍රිකා සම්බන්ධ වැරදි

- ඡන්ද පත්‍රිකාවන් හෝ නිල ලකුණක් විකෘති කිරීම
- නිල බලයක් නොමැතිව ඡන්ද පත්‍රිකාවක් යම් තැනැත්තෙකුට සැපයීම
- ඡන්ද පත්‍රිකා මිලදී ගැනීම හෝ සැපයීම
- නිල ලකුණ යෙදා ඇති ඡන්ද පත්‍රිකාවන් තම සන්තකයෙහි තබා ගැනීම
- ළකුණු කරන ලද ඡන්ද පත්‍රිකාවක් ඡන්දපොළ තුළදි ප්‍රදර්ශනය කිරීම
- ඡන්ද පත්‍රිකාවන් නොවන දෙයක් ඡන්ද පෙට්ටියට දැමීම
- ඡන්ද පත්‍රිකාවක් බලය නොමැතිව ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටතට ගෙනයාම
- ඡන්ද පෙට්ටියක් හෝ මුද්‍රා තැබූ ඡන්ද පත්‍රිකා නිල බලයක් නොමැතිව විවෘත කිරීම හෝ විනාශ කිරීම
- ඡන්ද පත්‍රිකාවන් බලය නොමැතිව මුද්‍රණය කිරීම

- ඡන්දය දීමට නීත්‍යනුකූලව නොහැකි බව හෝ ඡන්දය දීම තමා නුසුදුස්සෙකුව සිටින බව දැන දැනම ඡන්දය භාවිතා කිරීම

## V. ඡන්ද දිනයේ තහනම් ක්‍රියා

මැතිවරණය පවත්වන ඡන්ද පොල ඇතුළත හෝ ඡන්ද පොළට ඇතුළුවන ස්ථානයේ සිට කිලෝමීටර් භාගයක දුර ඇතුළත

1. ඡන්දය ඉල්ලීම
2. යම් පක්ෂයකට ඡන්දය නොදෙන ලෙස ඡන්ද හිමියන් පෙළඹවීම
3. ඡන්ද ප්‍රචාරක පත්‍රිකා බෙදීම හෝ වෙනත් ප්‍රචාරක කටයුතු තහනම් වේ.

එසේම ඡන්ද පොලකට ඇතුළුවන, දොරටුව අසල වූ යම් පොදු හෝ පෞද්ගලික ස්ථානයකදී ශබ්ද විකාශන යන්ත්‍ර හෝ වෙනත් ඕනෑම මිනිස් කටහඬ විස්ථාරණය හෝ ප්‍රති උත්පාදනය කරන යන්ත්‍ර ඡන්ද පොල නිළධාරීන්ට හෝ ඡන්ද පොළට පැමිණෙන අයට බාධාවක් ඇතිවන පරිදි ක්‍රියා කිරීම වරදකි.

එසේම ඡන්ද පොළකට ඇතුළුවන දොරටුව ළගත් ඡන්ද පොළ අසලත් අසංවර ලෙස ක්‍රියා කිරීම වරදකි.

## VI. දූෂණ ක්‍රියා

- ජීවත්ව සිටින හෝ මිය ගොස් ඇති හෝ ව්‍යාජ පුද්ගලයකු හෝ වෙනත් යම් තැනැත්තකු වශයෙන් පෙනී සිටිමින් ඡන්දය දීම.
- තමාගේම නමින් හෝ නම් යටතේ ඡන්ද විමසීමේදී එක් වරකට වඩා ඡන්දය දීම.
- තමාට ඡන්දය දීම වෙනුවෙන් හෝ වෙනත් අයෙකුට ඡන්දය දීම වැළැක්වීම වෙනුවෙන් දූෂිත ලෙස බලපෑම් කිරීම සඳහා යම් සංග්‍රහයක් කිරීම හෝ එවැනි සංග්‍රහයක් ලබා ගැනීම.
- යම් ආගමික රැස්වීම්වලදි ඡන්ද හිමියන් යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය දීමට හෝ නොදීමට පෙළඹවීම.
- ඡන්දය දීම හෝ නොදීම නිසා ආගමික සංවිධානයකින් නෙරපන බවට බලපෑම් කිරිම.
- යම් අපේක්ෂයකුට ඡන්දය දීම හෝ නොදීම නිසා සේවයෙන් නෙරපන බවට හෝ යම් ප්‍රතිලාභ හෝ සේවාවන් අත්හිටුවන බවට සේවා යෝජකයකු විසින් සේවකයන්ට බලපෑම් කිරීම.
- ඡන්දය දීම හෝ නොදීම සඳහා අල්ලස් ගැනීම.

# 5. මැතිවරණ නිලධාරීන්ගේ දුරකථන සම්බන්ධතා

**මැතිවරණ මහලේකම් කාර්යාලය**

තැ:පෙ: 03 සරණ මාවත, රාජගිරිය - 10107

දුරකථන -011-2868441, 011-2868442, 011-2868443 ෆැක්ස්-011-2868426

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල

| | දිස්ත්‍රික් කාර්යාලය | දුරකතනය | ෆැක්ස් |
|---|---|---|---|
| 1 | අනුරාධපුර | 025-2222551 | 025-2222551 |
| 2 | අම්පාර | 063-2224342 | 063-2222077 |
| 3 | බදුල්ල | 055-2222424 | 055-2222424 |
| 4 | මඩකලපුව | 065-2224312 | 065-2224374 |
| 5 | කොළඹ(නගර) | 011-2872247 | 011-2872248 |
| 6 | කොළඹ(දිස්ත්‍රික්) | 011-2867472 | 011-2867471 |
| 7 | ගම්පහ | 033-2222047 | 033-2222047 |
| 8 | ගාල්ල | 091-2234028 | 091-2234028 |
| 9 | හම්බන්තොට | 047-2256248 | 047-2256248 |
| 10 | යාපනය | 021-2222655 | 021-2228002 |
| 11 | කළුතර | 034-2222266 | 034-2222266 |
| 12 | මහනුවර | 081-2233187 | 081-2233187 |
| 13 | කෑගල්ල | 035-2222561 | 035-2222561 |
| 14 | කුරුණෑගල | 037-2222369 | 037-2222369 |
| 15 | මාතලේ | 066-2222422 | 066-2222422 |
| 16 | මාතර | 041-2222305 | 041-2222305 |
| 17 | මන්නාරම | 023-2222289 | 023-2222289 |
| 18 | මොණරාගල | 055-2276315 | 055-2276315 |
| 19 | නුවරඑළිය | 052-2222325 | 052-2222325 |
| 20 | පොලොන්නරුව | 027-2222012 | 027-2222012 |
| 21 | පුත්තලම | 032-2265246 | 032-2265246 |
| 22 | රත්නපුර | 045-2222023 | 045-2222023 |
| 23 | ත්‍රිකුණාමළය | 026-2222304 | 026-2222304 |
| 24 | වවුනියාව | 024-2222311 | 024-2222311 |
| 25 | කිලිනොච්චි | 021-2285664 | 021-2285664 |
| 26 | මුලතිව් | 021-2061426 | 021-2061426 |

(මැතිවරණ දෙපාර්තමේන්තුවේ නිළවෙබ් අඩවිය වන http://www.slelections.gov.lk/ වෙතින් උපුටා ගන්නා ලදී (2017 දෙසැම්බර් 29 දින))

# 6. මැතිවරණ නිරීක්ෂණ ආයතන

| සංවිධානය | ලිපිනය | දුරකථන |
|---|---|---|
| නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CAFFE) | 100/19A, වැලිකඩවත්ත පාර, රාජගිරිය | 0114 341 524<br>0114 341 514 |
| නිදහස් සහ සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL) | 12/3, රොබට් ටෙරස් රොබට් ගුණවර්ධන මාවත, කොළඹ | 0112 514 441<br>0112 514 442 |
| මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) | අංක 6/5 ලෙයාර්ඩ්ස් පාර, කොළඹ-5 | 0112565304-6 |
| පොදු දේපළ රැකගැනීමේ ව්‍යාපාරය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා | අංක 5/1 එලිබෑන්ක් පාර, කොළඹ-05 | 0114 369 781<br>0114 369 782<br>0114 369 783 |
| මැතිවරණ නිරීක්ෂණ ජාලය | 27, ඩී.එම්.කොළඹගේ මාවත, රාජගිරිය. | 0714 292 326 |
| ජාතික මැතිවරණ නිරික්ෂණ මධ්‍යස්ථානය | 5 වෙනි මහල, කාල්ර්ෂු පටුමග අංක - 195, බේස්ලයින් පාර, කොළඹ - 9 | 0773 130 179<br>0112 671 417 |
| ලක්බිමේ මව්වරු හා දියණියෝ | ජනාවබෝධ කේන්ද්‍රය 64, හලාවත පාර මීගමුව | 0332 233 466 |
| නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ව්‍යාපාරය-MFFE | අංක 24/13 විජයබා මාවත, නාවල පාර, නුගේගොඩ. | 0112 822 375 |